**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය - 2022**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මහලේකම් කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහලේකම් කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහලේකම් කාර්යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පනතේ 7(3) වගන්තිය | (i) | පාලක සභාව විසින් යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් රැස්විය යුතු වුවත්, 2022 වර්ෂය සඳහා රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි | රටේ පැවති දේශපාලන හා ඉන්ධන වැනි අර්බුදකාරි හේතුන් මත ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභා රැස්වීම් 03 කට සීමා විය. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය . |
| | | (ii) | සභාවේ සාමාජිකයන් රැස්වී සාකච්ඡා කර තීන්දු තීරණ වලට එළඹීමට අවකාශය සලසා ගැනීම යහපත් තත්ත්වයක නොපැවතීම හේතුවෙන් සභාවේ කාර්යයන් ප්‍රමාණාත්මක ලෙස ඉටුකිරීමේ ඉඩකඩ සලසාගෙන නොතිබුණි. ඒ තුලින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ලා අහිතකර ලෙස බලපා තිබුණි. | ජාතික සභා රැස්වීම්වලට අමතරව අනුකමිටු සභාවාර 12 ක් පවත්වා එම කමිටුවල නිර්දේශ පාලක සභා රැස්වීම් වෙත යොමු කර අවශ්‍ය තීරණ ගෙන ඇත. | නියමිත වේලාවට සභාවේ සාමාජිකයින් රැස්වී සභාවේ කාර්යයන් සඳහා තීරණ ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.81,537,169 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.183,179 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,353,990 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සුපිරි වාසනා ලොතරැයි ආදායම රු.77,116,750 ක් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ නිවාස ආධාර වැඩසටහනට 2021 දෙසැම්බර් 31 වන විට රු.5,985,145 ක මුදලක් හා 2022 දෙසැම්බර් 31 වන විට රු.90,012,050 ක මුදලක් නිවාස ආධාර වශයෙන් ලැබිය යුතු වුවත් රු.13,400,000 ක මුදල් ප්‍රමාණය පමණක් ලබාගෙන ඇති අතර ඉතිරිය රු.82,597,195 ක් හිඟ ආදායම් වේ. මේ හේතුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණු නිසියාකාරව සාක්ෂාත් කර ගෙන නොතිබුණි. | විගණනයෙන් පසු ජාතික ලොතරැයි මණ්ඩලය වෙතින් ලැබිය යුතු ආදායම පිළිබඳව ලිඛිතව තොරතුරු ලබා ගන්නා ලදී. ජාතික ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිගේ අංක NLB/FIN/OF/03/02/ii දරණ 2023 මාර්තු 28 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති තොරතුරු අනුව මහා භාණ්ඩාගාරය විසින් ලබාදීමට එකඟ වූ හා ලබාදී තිබුණු මුදල නිවැරදි බව තහවුරු විය. | හිඟ ආදායම් භාණ්ඩාගාරයෙන් ලබා ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආබාධ සහිත තැනැත්තන්ට සමාන අවස්ථා ලබාදීම , සවිබල ගැන්වීම, සුභසාධනය හා සුභසිද්ධිය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය , වයස් ව්‍යුහය, අබාධිත තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා අබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීම සම්බන්ධයෙන් පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන්ද පෙන්වා දුන් නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා කාර්යක්ෂම ලෙස පියවර ගෙන නොතිබුණි. | සමාජ ප්‍රතිලාභ මණ්ඩලය මඟින් එක්රැස් කරන දත්ත ලබාගැනීමටත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන දත්ත පද්ධතිය මඟින් මෙම දත්ත එකතු කර ගැනීමට කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | දත්ත පද්ධතියක් ක්‍රියාත්මක තත්වයේ පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනයට, අභිසංවර්ධනයට හා ආරක්ෂා කිරීමට වගබලා ගැනීම වෙනුවෙන් වූ පහත දැක්වෙන කාර්යයන් ඉටුකිරීමට ජාතික සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | | |
| (i) | ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභසාධන ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අභිසංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම. | නව පනතක් හා සංඥා භාෂා පනතක් කෙටුම්පත් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී.ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රය සකස් කර අවසන් කර ඇත. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |
| (ii) | ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වූ අදාල ජාත්‍යන්තර ප්‍රකාශන සහ සම්මුති ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ අනුගමනය කරනු ලබන බවට වග බලා ගැනීම. | ජාත්‍යන්තර ප්‍රඥප්තියට අනුකූලව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත කෙටුම්පත් කර ඇත. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |
| (iii) | ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබාගත හැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම. | ආබාධ සහිත තැනැත්තන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ වෙබ් පිටුවෙහි සියලු සේවාවන් පිළිබඳ විස්තර ඇතුලත් කොට ඇත. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |
| (ඈ) | ආබාධවලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැනගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම. | ආබාධ සහිත තැනැත්තන් හා දිගු කාලීන රෝගවලට ගොදුරු වූවන් ආබාධ තත්ත්වයට පත්වීම වැළැක්වීම අරමුණු කර ගනිමින් වෛද්‍ය ආධාර වැඩසටහන ක්‍රියාත්මක වේ. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |
| (ඉ) | ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා ගතයුතු පියවර සකස් කොට ඒවා ප්‍රවර්ධනය කිරීම. | රැකවරණ මධ්‍යස්ථාන 06 ක් සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. ලෝක බැංකු ආධාර යටතේ පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය තුළින් අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ඉදි කිරීමේ කටයුතු 2022 වර්ෂයේ සිට සිදු කරමින් පවතී. දඹුල්ල රැකවරණ මධ්‍යස්ථානය සඳහා ඉඩම පවරා ගැනීමේ කටයුතු ද සිදු කරමින් පවතී. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම. | අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙහි දෙවන අදියර ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට සැලසුම්කර ඇත. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |
| (උ) | ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීම. | වර්තමානයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. රැකවරණ මධ්‍යස්ථාන 06 ඉදිකළ පසු ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සැලසීමද රැකබලා ගැනීම හා අවශ්‍ය පුහුණු ලබාදීම ද සිදුකළ හැකි වනු ඇත. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |
| (ඌ) | ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකි සේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩපිළිවෙල හඳුන්වාදීම සහ තොරතුරු ලබාගැනීමට සහ සන්නිවේදනයට ප්‍රවේශය ආබාධ සහිත තැනැත්තන්ට ලබාගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. | 2006 අංක 01 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ප්‍රවේශ නියෝගය ප්‍රකාරව. ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුව ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. මේ පිළිබඳව ප්‍රවාහන අමාත්‍යාංශය, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධ වී සාකච්ඡා පවත්වා සුදුසු තීරණ ගෙන ඇති බව කාරුණිකව දන්වමි. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |
| (එ) | ප්‍රකාශන එළ කිරීමෙන් සහ වෙනත් වැඩපිළිවෙලවල් මගින් ආබාධ සහිත තැනැත්තන්ගේ තත්ත්වය සහ අවශ්‍යතා පිළිබඳව මහජනයා දැනුවත් කිරීම. | 2022 වර්ෂයේ පවත්වන ලද ජංගම සේවා 19 හි දී හා දහසක් සවිබලගැන්වීමේ වැඩසටහන් 02 හි දී මහජනතාව දැනුවත් කරන ලදී. කාර්යාලීය වෙබ් පිටුව හරහා සහ මුහුණු පොතෙහි ආබාධ සහිත තැනැත්තන්ගේ ගිණුම මඟින් ද මහජනතාව දැනුවත් කරනු ලැබේ. දෙසැම්බර් 03 දිනට යෙදෙන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාත්‍යන්තර ආබාධිත දිනයට සමගාමීව ගුවන්විදුලි හා රූපවාහිනී වැඩසටහන්තුළින් මහජනතාව දැනුවත් කරන ලදී. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |
| (ඒ) | ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබාගත හැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම. | ආබාධ සහිත තැනැත්තනගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමේ ක්‍රම පිළිබඳ අධ්‍යයන සහ පර්යේෂණ සඳහා ධෛර්ය දීම හා සියලු ක්‍රියාකාරකම් විෂයෙහි ලා ඔවුන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම ඉහත (එ) සඳහන් | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ජාතික සභාවේ අවධානය යොමු කල යුතුය. |

වැඩසටහන් වෙබ් පිටුව, මුහුණු පොත සහ රූපවාහිනී හා ගුවන් විදුලි වැඩ සටහන්වලදී සුදුසු දැනුවත් කිරීම් හා ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී. ඊට අමතරව ස්වයං රැකියා ආධාර, අධ්‍යාපන ආධාර, වෛද්‍යාධාර, නිවාස ආධාර සහ මාසික ජීවනාධාර ලබා දී ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලදී.

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල සඳහා ලැබෙන රජයේ ප්‍රධාන උපයෝජනය කර ඉතිරිවන අතිරික්ත මුදල් ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.9,834,598 ක් වූ අතර ඉකුත් වර්ෂ 04 ක කාලය තුල එය රු.5,170,082 සිට රු.12,062,703 දක්වා පරාසයක වූ මුදල් ශේෂ බැංකු ජංගම ගිණුමේ රඳවා තිබුණි. 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 19 වෙනි වගන්තිය ප්‍රකාරව සභාවට අයත් යම් මුදලක් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ආයෝජනය කළ හැකි වුවත් ඉකුත් වර්ෂ 05 ක කාලය තුල එසේ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල අරමුදලට අහිමි වී තිබුණු පොලී ආදායම දල වශයෙන් රු.4,300,000 ක් බව නිරීක්ෂණය විය | 2023 දෙසැම්බර් 23 දින පැවති විගණන හා කළමනාකරණ රැස්වීමේ දී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සුදුසු බව නිර්දේශ කරන ලදී. එහිදී තීරණය කරන ලද පරිදි බත්තරමුල්ල, ලංකා බැංකු ශාඛාවේ (අධි ශ්‍රේණි) මිලියන 05 ක් දින 400 ක් සඳහා සියයට 25 ක වාර්ෂක පොලී අනුපාතයකට සහ මිලියන 02 ක් මාස 03 ක් සඳහා සියයට 24 ක වාර්ෂික පොලී අනුපාතයකට ස්ථාවර තැන්පතු ආරම්භ කරන ලදී. | පනතේ අරමුණු හා අනුගත වන පරිදි ක්‍රියා කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2018 මාර්තු 19 දින කාර්යය මණ්ඩලයේ තනතුරු අනුමත කර තිබුණද, බඳවාගැනීමේ පටිපාටිය පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අදාළ සංශෝධනයන් සිදු කරමින් පවතී. බ්‍රේල් උපදේශක තනතුර සඳහා සැකසූ බඳවා ගැනීම් පටිපාටිය, මෙම තනතුර ස්ථාපනය කරනු ලැබූ වෙනත් ආයතන සමග සම්බන්ධ වී එම ආයතනවල බඳවා ගැනීම් පටිපාටි සමග සංසදනය කරමින් අධ්‍යයනය කිරීමේ දී යම් යම් කරුණු සංශෝධනයන් කිරීමට සිදු වූ බැවින් එම කරුණු සම්බන්ධයෙන් අධ්‍යයනය කරමින් සිටී. | බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරගැනීමට කටයුතු කළ යුතුය. |